# අතීතයෙන් බිඳක්

1956 වසරේ කොළඹ ආනන්ද විදුහලේ 6 වන ශ්‍රේණියේ සිසුවකු ව සිටියදී එනම් වයස අවුරුදු 13 දී ලියූ, 'වෙසක් සැරසිල්ල' නම් වූ ලිපිය මුද්‍රණයෙන් පළවීම මගේ ප්‍රථම සාහිත්‍ය කටයුත්ත විය. එය පළ කර දුන්නේ එදා අප පන්තිය භාරව සිටි මෙන් ම අපට සිංහල ද ඉගැන් වූ ශ්‍රේෂ්ඨ ගුරු මාතාවක වන නොබෝදා අප අතරින් වියෝ වූ කමලා රාජපක්ෂ මැතිනියයි. සැම විට ම මා ඉතා ගෞරවයෙන් සිහිපත් කරන එතුමිය එදා මා පන්තියේ අභ්‍යාසයක් සඳහා ලියූ එම ලිපිය ඉතා අගය කරමින් අනෙකුත් ළමයින් ඉදිරියේ කියැවීමට සැලැස්සුවා ය. එපමණකින් නොනැවතී එවකට ආනන්දයේ මාසික ව පළ වූ 'සිංහල දරුවා' නම් වූ සඟරාවේ පළ කර දුන්නා ය. මගේ නම මුද්‍රිතව මුලින් ම පළ වූයේ එම සඟරාවේ ය. එයින් ධෛර්යමත් වූ මම එතැන් පටන් එවකට පළ වූ වෙනත් පුවත්පත්වලට ලිපි ලිවීමට පටන් ගතිමි. 'සිසුමිණ' නමින් ළමා පුවත්පතක් මුද්‍රිත ව පළ කිරීමට ද මට හැකි විය. එහෙත් එය එක කලාපයකට පමණක් සීමා කිරීමට මට සිදුවූයේ ඉගෙනීම කඩාකප්පල් කර ගනීවි ය යන විරෝධය මව්පියන්ගෙන් පළ වූ බැවිනි.

එහෙත් පුවත්පතක් පළ කළ යුතු ය යන සිතුවිල්ල සැම විට ම මා තුළ තිබිණි. අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීමෙන් පසු 1961 දී මම පුවත්පතක් පළ කිරීම ආරම්භ කළෙමි. එය 'හෙළබිම' නම් විය. 1961 පෙබරවාරි මස 4 දා සිට මාසික ව පළ කළ එම පුවත්පත ඉතා ජනප්‍රිය විය. මාසික පුවත්පතක් වූ 'හෙළබිම' එකල තිබූ එක ම ළමා පුවත්පත වූවා පමණක් නොව, ප්‍රේමකීර්ති ද අල්විස්, ඒ. ඩී. රංජිත් කුමාර, නිව්ටන් ගුණසේකර, මහාචාර්ය ජිනදාස දනන්සූරිය, අතුල මංචනායක, සිරි කහවල, චන්ද්‍රසේන රණවීර, මහාචාර්ය රවින්ද්‍ර ප්‍රනාන්දු ඇතුළු බොහෝ දෙනෙකුගේ ප්‍රථම ලිපිය පළ වූ පුවත්පත ද විය. පත්තර 20,000ක් අලෙවි වූ 'හෙළබිම' ට සැම පාසලක ම වාගේ නියෝජිතයින් සිටියහ. අද ඇමැතිවරයකු වන නිමල් සිරිපාල ද සිල්වා නාලන්දයේ නියෝජිතයා ව සිටියේ ය. 'හෙළබිම' මා මුද්‍රණයෙන් පළ කළේ එවකට ඩී. බී. ධනපාල මහතා කර්තෘත්වය දැරූ 'දිවයින' නම් වූ පුවත්පත පළ කළ දිවයින මුද්‍රණාලයේ ය. ඒ දිනවල ම ධනපාල මහතා 'දවස' පුවත්පත ආරම්භ කිරීමට සම්බන්ධ වීම නිසා 'දිවයින' අඩාල විය. මුද්‍රණය කළේ පිටපත් 2000 ක් පමණ ය. එකල සෝමසිරි කස්තුරිආරච්චි ද 'කවට අන්දරේ' නමින් විකට පුවත්පතක් එම මුද්‍රණාලයේ මුද්‍රණය කර පළ කළ සැටි මට සිහිවෙයි.

ආනන්ද මහ විදුහලේ ශිෂ්‍යයකුව සිටිමින් "හෙළබිම" පුවත්පත පළ කරන අතරතුරම 1962 දී මා මිත්‍ර නිමල් ආරියවංශ පෙරේරාගේ "සාහිත්‍ය සංග්‍රහය" නමැති කෘතිය පළ කරමින් ප්‍රකාශකයකු වශයෙන් මුල් පියවර තබන්නට ද මම සමත් වීමි. මගේ ප්‍රකාශක දිවියට දැන් හැට වසරක් පිරී තිබේ. එකී කාල පරිච්ඡේදය

තුළ බෞද්ධ පොත්, ස්වතන්ත්‍ර හා පරිවර්තන නවකතා ඇතුළු සිංහල සහ ඉංග්‍රීසි පොත් දෙ දහසක් පමණ පළ කරන්නට හැකිවීම ගැන මා තුළ හටගන්නා සතුට මෙතෙකැයි කියා නිම කළ නොහැක.

මා පළ කළ 'සිසුමිණ' ළමා පුවත්පතත්, හෙළබිම පත්‍රයේ විවිධ පිටු 24ක් පමණ නැවත ඒ අයුරින්ම මුද්‍රණය කොට වර්තමාන පාඨකයින්ට දැක බලා ගැනීමට පුවත්පතක් ලෙස දැන් පළකොට තිබේ.

මේ කාලයේ දවස පුවත්පතේ සේවය කළ පී. ඇම්. ජයතිලක මගේ සොහොයුරා සමඟ පේරාදෙණිය විශ්වවිද්‍යාලයයේ එකට උගත් අයෙකු විය. පී. ඇම්. ගේ කතාවක් 'ගිනිදැල්' නමින් එවකට 'රිවිදින' පුවත්පතේ කොටස් වශයෙන් පළ වූ අතර එය ඉතා ජනප්‍රිය ද විය. දිනක් පී. ඇම්. අප හමුවීමට පැමිණි මොහොතක 'ගිනිදැල්' පොතක් වශයෙන් පළ කරමුදැයි නිකමට මෙන් ඇසුවෙමි. පී. ඇම්. ගෙන් ලත් ධෛර්ය නිසා මම 'ගිනිදැල්' පළ කළෙමි. මුද්‍රණය කළේ අසෝක බටදූවආරච්චි ය. පිටපත් 2000 ක් මුද්‍රණය කළ 'ගිනිදැල්' ඉතා කෙටි කාලයක් තුළ විකිණී අවසන් විය.

දයාවංශ ජයකොඩි සහ සමාගම නමින් පළ කළ ප්‍රථම පොත 'ගිනිදැල්' විය. මීට පෙර මා පොත් පළ කර තිබුණේ "හෙළබිම" ප්‍රකාශකයෝ නමිනි. නිමල් ආරියවංශ පෙරේරාගේ "සාහිත්‍ය සංග්‍රහය" ප්‍රථම 'හෙළබිම' ප්‍රකාශනය විය. නිමල් සේදරගේ "කටු අග පිපි මල්", බී. එච්. ලෙස්ලි සිරිසේනගේ "කෝ අම්මෙ තාත්තා", ප්‍රේමදාස ගමගේගේ "පළගැටියෝ", මා සමඟ එක ම පන්තියේ උගත් ධර්මකීර්ති ජයසේකර (පසුව කීර්ති බාලසූරිය) ගේ "රතු කඳුළු" මා පළ කළ හෙළබිම ප්‍රකාශන කිහිපයකි.

"ගිනිදැල්" නවකතාවේ සාර්ථකත්වය නිසා දිගට ම පොත් පළ කිරීම ආරම්භ කළෙමි. කුමාර කරුණාරත්නගේ පැමිණීම විශාල රුකුලක් විය. ඔහුගේ පොත් ජනප්‍රිය වූවා සේ ම ඉතා හොඳින් අලෙවි විය. 1971 දී පළ වූ කුමාරගේ 'සිතට සිතක්' පොත් 13000 ක් දින 07 ක් තුළ විකුණූ අයුරු මට කිසිදා අමතක නොවේ.

එඩ්වඩ් මල්ලවආරච්චි ගෙන ආ "ප්‍රාර්ථනා" පළ කිරීමට පසුබට වූ නිසා ඔහු ම එය පළ කළේ ය. ඉතා සාර්ථක ප්‍රතිඵල ගෙන ආ "ප්‍රාර්ථනා" තුන්වන මුද්‍රණයේ සිට ඔහුගේ සියලු පොත් පළ කිරීමේ භාග්‍යය මට ලැබිණ. අද එඩ්වඩ් මල්ලවආරච්චි ඔහුගේ පොත් ඔහු ම පළ කරයි. මගේ දිරිමත් කිරීම නිසා ආරම්භ කළ ඔහුගේ මෙම ව්‍යාපාරය සාර්ථක ව කරගෙන යාම මට විශාල සතුටක් ගෙන දෙයි. කුමාර කරුණාරත්නත් එසේ ම ය.

ජයසේන ජයකොඩි, ජයකොඩි සෙනෙවිරත්න, නිව්ටන් ගුණසේකර, සෝමවීර සේනානායක සහ ආර්.ආර්. සමරකෝන් එදා මෙන් ම අදත් නොවෙනස් ව මා හා බැඳුණු මගේ කල්‍යාණ මිත්‍ර ලේඛකයින් ය. අප ආයතනය දියුණුවෙන් දියුණුවට ගෙන ඒමට මුල් වූයේ මේ ලේඛකයින්ය. අපට ප්‍රථම රාජ්‍ය සාහිත්‍ය සම්මානය ගෙන ආවේ ආර්. ආර්. සමරකෝන් ලියූ "ගේ කුරුල්ලෝ" නවකතාව ය. අනෙකුත්

ලේඛකයින් සියලු දෙනා ම රාජ්‍ය සාහිත්‍ය සම්මාන කීප වතාවක් ම දිනාගෙන තිබේ. මේ ලේඛකයින් සියලු දෙනාගේ ම ප්‍රථම නවකතාව පළ කිරීමේ භාග්‍යය ලැබුණේ මට බැවින් ඔවුන්ගේ වර්තමාන තත්ත්වය දෙස බලා වැඩි ම සතුටක් ලබන ප්‍රකාශකයා මෙන් ම පාඨකයා ද මම වෙමි.

ඉන් අනතුරුව අප සොයා පැමිණි කරුණාසේන ජයලත්, ජී. බී. සේනානායක, හිටපු ජනපති ආර්. ප්‍රේමදාස, ගුණදාස ලියනගේ, කේ.ජී. කරුණාතිලක, චන්ද්‍රා අනගිරත්න, ප්‍රේමසිරි මාහිංගොඩ, ලීල් ගුණසේකර, එස්. චන්ද්‍රසිරි දසනායක, ටී.බී. ඉලංගරත්න, යසවර්ධන රුද්රිගු, කරුණාදාස සූරියආරච්චි, ඔරුවල බන්දු, ධීමන් ආනන්ද, විමලසේන ඉහළගම, මාලිංග අමරසිංහ, මහාචාර්ය බන්දුසේන ගුණසේකර, තිලක කුඩාහෙට්ටි, ලක්ෂ්මන් කහටපිටිය, රූ. පෙ. විජේසිංහ, නෝමන් සිරිපාල, සීසර් සුදුසිංහ, දයාපාල ජයනෙත්ති, ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි, ඒ.එම්. කරුණාරත්න, දඹානේ ගුණවර්ධන, සිරිලාල් කොඩිකාර, මහාචාර්ය ඉන්ද්‍රකීර්ති සිරිවීර, ගාමිණී විජිත් සමරකෝන්, සරත්චන්ද්‍ර ජයකොඩි, පාලිත ජයකොඩි වැනි කතුවරයින්ගේ පොත් ද පළ කිරීමට ලැබීම මා ලැබූ විශාල ජයග්‍රහණයක් වෙයි. අප ආයතනය දියුණුවෙන් දියුණුවට ගෙන ආවේ ඔවුන් බව ගෞරවයෙන් සඳහන් කරමි.

පියා මා වෙනුවෙන් ඉදිකර දුන් ගොඩනැගිල්ලෙහි වූ ලී බඩු ව්‍යාපාරය වසා දමා එය සම්පූර්ණ පොත් ප්‍රකාශන ආයතනයක් කළෙමි. ලී බඩු විකිණීම ලාභදායී ව්‍යාපාරයක් වුව ද, අඩු ආදායමක් ඇති පොත් විකිණීම මගේ සතුටට හේතු වූ බැවිනි. අද එය මම සාර්ථක ව පවත්වාගෙන යන්නෙමි.

ඒ සාර්ථකත්වයට මගේ ලේඛකයින් මෙන් ම මගේ සේවක පිරිස ද ඉවහල් වූ බව ස්තුති පූර්වක ව සඳහන් කරමි. මගේ ප්‍රථම සේවකයා වූයේ ධර්මදාස පණ්ඩිතරත්නය. අවුරුදු ගණනාවක් ඉතා දක්ෂ ලෙස අවංක ව මා හා සේවය කළ ඔහු දැන් යක්කල 'විශ්ව පොත් මැඳුර' නමින් ඔහුගේම පොත් මැදුරක් සාර්ථක ව පවත්වාගෙන යයි. අද සුප්‍රකට ගණකාධිකාරි දේශකයකු ව සිටින අරුණ රාජමන්ත්‍රී ද විශ්වවිද්‍යාලයට ඇතුළු වන තෙක් මා ළඟ සේවය කළ අති දක්ෂ කළමනාකරුවෙකි.

අවුරුදු විස්සකට වැඩි කාලයක් තිස්සේ මට සේවය කරන මගේම දරුවන් වැනි සුසිල් හේවගේ, ජගත් දයානන්ද, නිශාන්ත වන්නිආරච්චි සහ ගයාන් සුරංග මගේ සාර්ථකත්වයේ සහකරුවන් ය. පමෝද් පියුෂාන් ද අප ප්‍රකාශන රාශියක් පරිගණක අක්ෂර සංයෝජනය කරන විශිෂ්ට ගණයේ සේවකයෙකි.

නවකතා පොත් කිහිපයක්ම මා අතින් ලියැවී ඇතත්, ඒවා පළ කිරීමට මේ වනතුරු මා තුළ උනන්දුවක් ඇති නොවිණ. එහෙත් දීර්ඝ කාලයක් තිස්සේ ඉතිහාස පතපොත හදාරමින් කරුණු රැස් කළ මා තුළ "සිංහලේ ජාතික සටන්" ලිවීමට හා පළ කිරීමට නම් හටගත්තේ පුදුම උනන්දුවක් බව කිව යුතුය.

ඉතා කෙටි කලක් තුළ මෙහි හය වැනි මුද්‍රණය ද පිට කරන්නට හැකිවීම මගේ ව්‍යායාමය පළ දැරීමකැයි මට සන්තෝෂ විය හැක.

මෙරට බෞද්ධ අබෞද්ධ සියලු ජනතාව අතර අතිශය සම්භාවනාවටත් ගෞරවාදරයටත් පාත්‍ර වූ අති පූජ්‍ය ගංගොඩවිල සෝම හිමිපාණන්ගේ ඇසුර සමීප වීමත් සමඟ 'බුද්ධස්තූප' නමැති පොතෙන් ආරම්භ කොට උන්වහන්සේ ලියූ සියලුම පතපොත පළ කරන්නට ලැබීම මා ලද උතුම් වූ භාග්‍යයකි.

කිරිබත්ගොඩ ඤාණානන්ද හිමිපාණන් වහන්සේ කෙනෙකුට ජීවිතයේ දී ඉතා කලාතුරකින් මුණ ගැසෙන අන්දමේ අති ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයාණන් වහන්සේ නමකි. වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම කල්‍යාණ මිත්‍රයාණ කෙනෙකි. උන්වහන්සේ ලියූ ධර්ම ග්‍රන්ථ පළ කරමින් බෞද්ධ ධර්මය ප්‍රචාරය කිරීමේ අවස්ථාව ලබන්නට මා කොයි තරම් පින් කර ඇත්දැයි මට සිතේ. 'ඒ අමා නිවන් සුව දුර නොවේ' නම් වූ බෞද්ධ ග්‍රන්ථය මා ප්‍රකාශයට පත් කළ උන්වහන්සේගේ පළමු ග්‍රන්ථයයි. මේ වනවිට එය විසිපස් වතාවකටත් වඩා මුද්‍රණයන් පළවී තිබේ.

අති පූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනාහිමි, පූජ්‍ය එල්ලාවල මෙධානන්ද හිමි, පූජ්‍ය මීගොඩ පඤ්ඤාලෝක හිමි, පූජ්‍ය බෝපිටියේ ඥානාවාස හිමි, පූජ්‍ය වැලමිටියාවේ ධම්මරක්ඛිත හිමි, පූජ්‍ය පරවාහැර චන්ද්‍රරතන හිමි, පූජ්‍ය බොරැල්ලේ කෝවිද හිමි, පූජ්‍ය අත්තුඩාවේ රාහුල නාහිමි, පූජ්‍ය මහාචාර්ය දේවාලේගම මේධානන්ද හිමි, පූජ්‍ය තාඹුගල ආනන්ද සිරි හිමි ආදී බුද්ධ පුත්‍රයන් වහන්සේලාගේ ද, ගයාන් චානුක විදානපතිරණ වැනි ගිහි සැදැහැවතුන්ගේ ද බෞද්ධ පතපොත රැසක් දයාවංශ ජයකොඩි ප්‍රකාශන ලෙසින් පළ කරන්නට මම සමත් වී සිටිමි. කැලණිය විශ්වවිද්‍යාලයේ විශේෂ ශාස්ත්‍රවේදී ගෞරව උපාධියෙන් ප්‍රථම පංතියේ සාමාර්ථය ලබා සිටින ගයාන් චානුක විදානපතිරණගෙන් බෞද්ධ සාහිත්‍යයට ඉටුවන මෙහෙය අප්‍රමාණය.

මගේ ආදරණීය පතිනිය වෙරෝනිකා දමයන්ති ජයකොඩි ලියූ බෞද්ධ පතපොත රැසක් ද මේ වන විට ප්‍රකාශයට පත් වී තිබේ. ඇය ලියූ "අපේ බුදුහාමුදුරුවෝ", "THE JEWEL OF THE UNIVERSE" , "නළා කාරයා", "බුදුදහමයි මහ මුහුදයි කැලණිතිස්ස රජ්ජුරුවොයි", "දෙවියෝ එහි වැඩියහ", "අපේ ජාතික කොඩියේ සිංහ නාදය", "උතුම් තුණුරුවන අපේ එකම පිහිටයි" "අපේ බෝසතාණන් වහන්සේ ආශ්චර්යවත්මයි! අද්භූතමයි!" සහ "ගෞතම බුද්ධ චරිතය 1. බෝසතාණන් වහන්සේ" ඇතුළු ගෞතම බුද්ධ චරිත පෙත්පෙළ මේ වන විට නැවත නැවත පළකරන කෘතීන් බවට පත් වී තිබේ.

මගේ පොත් වෙළෙඳ සල පිහිටි මාවත ආරම්භයේ ටිබෙට් ඇස්. මහින්ද හිමියන්ගේ පිළිරුවක් ඉදිකිරීමට මා කටයුතු කළේ උන්වහන්සේ විසින් මේ රටට ජාතියට හා බෞද්ධාගමට කළ අප්‍රමාණ වූ මෙහෙවර සලකා ගනිමිනි. ඉන්පසු ව එම මාවත පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත ලෙසින් එවකට අගමැතිව සිටි ආර්. ප්‍රේමදාස මහතා මගින් නම් කරවා ගන්නට ද මම සමත් වූයෙමි. අති පූජ්‍ය ගංගොඩවිල සෝම හිමිපාණන් වහන්සේ අපවත් වූ පසු උන්වහන්සේගේ

පිළිරුවක් ද අති පූජ්‍ය මහින්ද හිමියන්ගේ පිළිරුව අසලින්ම පිහිටුවීමට මට හැකි විය. මෙම ප්‍රතිමා දෙකම ඇස්. මහින්ද හිමි මාවත ආරම්භ වන ස්ථානයේ දැන් දැක ගත හැකිය.

ලෝකයේ බොහෝ රටවල සංචාරය කර ඇති මම එක් සත්‍යයක් වටහාගෙන සිටිමි. එම සත්‍යය නම් ශ්‍රී ලංකාව තරම් වාසනාවන්ත රටක් ලෝකයේ තවත් නැති බව ය. ශ්‍රී ලංකාවේ වෙසෙන ජනතාව ආගන්තුක සත්කාරයට ලැදි ඉතා කරුණාවන්ත පිරිසකි. බෞද්ධ ශික්ෂණය තුළින් ඔවුහු මිනිසත් බව පිළිබඳ හොඳ අවබෝධයක් ලබා සිටිති. මේ යහපත් ජනතාවට පිරිසිදු බුද්ධ ධර්මය පිළිබඳ අවබෝධයක් ලබා දීමත්, වඩාත් යහපත් රටක් නිර්මාණය කිරීම සඳහා ඔවුන් දැනුමෙන් පෝෂණය කිරීමත් ග්‍රන්ථ ප්‍රකාශකයකු වශයෙන් මගේ වගකීමත් යුතුකමත් යැයි මම විශ්වාස කරමි. පාඨකයාට අති විශාල සේවාවක් ග්‍රන්ථ ප්‍රකාශකයකු ලෙසින් ඉටුකරන්නට හැකි වීම පිළිබඳව මා තුළ ඇත්තේ නිහතමානීව විඳ ගන්නා අප්‍රමාණ වූ සන්තුෂ්ඨියකි. ඒ සන්තුෂ්ඨිය මා නිවන කරා කැඳවාගෙන යන බව මගේ පරම විශ්වාසයයි.

**ඔබ සැමට තෙරුවන් සරණයි !**



*දයාවංශ ජයකොඩි*

163/5, සිරිධම්ම මාවත
කොළඹ - 10
29. 08. 2020